# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
## මහජන ආරක්ෂක අමාත්‍යාංශය
## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු ආරාධනය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඩෙස්ක්ටොප් පරිගණක 75 ක් සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය

IFB **අංකය :** DIE/PRO/**06/2024/12**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඩෙස්ක්ටොප් පරිගණක 75ක් සැපයීමේ, බෙදීමේ, ස්ථාපිත කිරීමේ, හැඩ ගැස්වීමේ සහ නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

3. රුපියල් හයදහසක (රු.6,000.00) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", 05 වන මහලේ, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් 2024.10.03 දින සිට 2024.10.22 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළදී මිලදී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළදී 0112 - 101559 දරන දුරකථන අංකය අමතා ලබා ගත හැක. 2024.10.03 දින සිට 2024.10.22 දින දක්වා 3 වැනි ඡේදයේ සඳහන්ව ඇති ලිපිනයේ පිහිටි කාර්යාලයට පැමිණ හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.immigration.gov.lk හරහා හෝ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක.

5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනමම කවර වල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා තබා මෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කර පහත සඳහන් කර ඇති ලිපිනයට 2024.10.23 වැනි දින ප.ව. 2.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනවිත් ඒ සඳහා 3 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ තබා ඇති පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය. භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින අනූ එකක් (91) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගු කරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගුභාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**05 වැනි මහල,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, " සුහුරුපාය ",**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**

6. 2024.10.11 වෙනි දින ප.ව. 2.00 ට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, " සුහුරුපාය ", ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, 05 වන මහලේ දී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.

**සභාපති,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**" සුහුරුපාය ", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**